**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "බී" අර්ථසාධක අරමුදල - 2013**

---

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "බී" අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I කොටස : (I) වගන්තිය සාමාන්‍ය 9 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "බී" අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කල් පිරීමේදී ලැබිය යුතු පොළිය ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.4,285,426 ක් වූ ස්ථාවර තැන්පතු රු.187,187 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු මත පොළී සහ ලැබිය යුතු පොළී පිළිවෙලින් රු.119,692 කින් හා රු.80,653 කින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) අර්ථ සාධක අරමුදලේ "ඒ" සහ "බී" මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කේවල අරමුදල් ශේෂයන් හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්රකාශනවල දැක්වෙන අනුරූපී ශේෂයන් අතර රු.11,140,713 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ රීති අංක 04 අනුව සාමාජිකයන්ගේ බැරට පවත්නා සියළු මුදල් රජයේ බැංකුවක ණයකරවල හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. කෙසේ වුවද මෙම සියළු මුදල් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.840,061 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.2,299,550 ක් වූයෙන් රු.1,459,489 කින් හෙවත් සියයට 63.4 කින් මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමක් දැක්වුණි. මෙම සෘණාත්මක උපනතියට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සමාලෝචිත වර්ෂය තුළ රු.1,048,196 කින් ආයෝජන පොළී ආදායම අඩුවීම හා රු.514,514 කින් බැංකුවේ අතිරේක දායකය අඩුවීමයි.

## 3.2 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.2.1 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

ලබාගත හැකිවූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂ 3 තුළ හා සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵල සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ස්ථාවර තැන්පතු මත පොළී ආදායම, ඉතිරි කිරීම් ගිණුම් සහ සාමාජිකයන්ට දෙන ලද ණය | 343,215 | 1,391,412 | 1,742,517 | 2,065,612 |
| බැංකුවෙන් ලැබුණු අතිරේක දායකය | 580,852 | 1,095,370 | 251,853 | 268,028 |
| මුළු ආදායම | 924,067 | 2,486,782 | 1,994,370 | 2,333,640 |
| වියදම් | (84,006) | (187,232) | (181,306) | (212,149) |
| වර්ෂය සඳහා අතිරික්තය /(ඌනතාවය ) | 840,061 | 2,299,550 | 1,813,064 | 2,121,491 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ සාමාජිකයන් විශ්‍රාම යාම හේතුවෙන් 2010 සිට 2013 කාලපරිච්ඡේදය තුළදී ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීම් ගිණුම් මත පොළී ආදායම රු.1,976,387 සිට රු.343,215 දක්වා එනම්, සියයට 82.6 කින් අඩුවී තිබුණි.

(ආ) 2010 සිට 2012 කාල පරිච්ඡේදය තුළදී, සාමාජිකයන්ට දෙන ලද ණය මත පොළී ආදායම රු.89,225 සිට රු.110,860 දක්වා එනම්, සියයට 24.4 කින් වැඩිවී තිබුණි. කෙසේ වුවද පවත්නා ණය නිරවුල් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී, සාමාජිකයන්ට දෙන ලද ණය මත පොළී ආදායම සඳහා කිසිදු පොළී ආදායමක් උපයා නොතිබුණි.

(ඇ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී බැංකුවෙන් ලැබුණු අතිරේක දායකය රු.1,095,370 සිට රු.580,852 දක්වා එනම්, සියයට 46.9 කින් අඩුවී තිබුණු අතර, සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද මුළු පොළිය රු.2,299,550 සිට රු.840,061 දක්වා එනම් සියයට 63.4 කින් සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි.

### 3.2.2 සාමාජික දායකය

-------------------

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අරමුදලට ලැබුණු දායකය හා පොළී සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 | | | | 2012 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික දායකත්වය | බැංකුවේ දායකත්වය | බැර කරන ලද පොළී | එකතුව | සාමාජික දායකයත්වය | බැංකුවේ දායකයත්වය | බැර කරන ලද පොළී | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 996,709 | 1,494,889 | 4,224,720 | 6,716,318 | 3,325,548 | 4,981,852 | 12,151,352 | 20,458,752 |
| <u>එකතු කළා</u> | | | | | | | | |
| වර්ෂය තුළ ලැබීම් | 93,184 | 139,776 | 840,061 | 8,073,021 | 231,543 | 347,313 | 2,271,478 | 2,850,334 |
| එකතුව | 1,089,893 | 1,634,665 | 5,064,781 | 7,789,339 | 3,557,091 | 5,329,165 | 14,422,830 | 23,309,086 |
| <u>අඩුකළා</u> | | | | | | | | |
| සාමාජිකයන්ට ආපසු ගෙවීම් | - | - | - | - | (2,560,382) | (3,834,276) | (10,198,110) | (16,592,768) |
| වැඩිපුර බැර කරන ලද පොළී | - | - | (30,644) | (30,644) | - | - | - | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,089,893 | 1,634,665 | 5,034,137 | 7,758,695 | 996,709 | 1,494,889 | 4,224,720 | 6,716,318 |

2012 වර්ෂය සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේ අරමුදලට මුළු දායකය රු.1,777,313 කින් එනම්, සියයට 62.3 කින් වැඩිවී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී සාමාජිකයන්ට කිසිදු ගෙවීමක් සිදුකර නොතිබුණි.

**3.2.3 සාමාජිකයන්ට ලබාදුන් ණය**

-------------------------------

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ට ලබාදෙන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | අවසන් වර්ෂය | |
|---|---|---|
| | **2013** | **2012** |
| | රු. | රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 7,274 | 892,467 |
| **එකතු කළා** | | |
| වර්ෂය තුළ සාමාජිකයන්ට ලබාදුන් ණය | - | 350,000 |
| | 7,274 | 1,242,467 |
| **අඩුකළා** | | |
| වර්ෂය තුළ අයකර ගැනීම් | - | (1,235,192) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 7,274 | 7,275 |

සමාලෝචිත වර්ෂය තුළ සමාජිකයන්ට කිසිඳු ණය මුදලක් ලබාදී නොතිබුණු අතර පෙර වර්ෂවලදී ලබාදී තිබු සියළු ණය සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කර තිබුණි.

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

------------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

------------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී මාස 2 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2014 ජූලි 08 දිනදීය.

**4.2 අරමුදල පිහිටුවීම, අධිකාරි බලය සහ අරමුණු**

-----------------------------------------------

1975 අංක 13 දරන ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 85(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "බී" අර්ථසාධක අරමුදල පිහිටුවන ලදි. ඒ අනුව මාසික වැටුප් ලබන ලංකා කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාවේ සියළුම සේවකයන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සේවකයන් ලෙස සලකනු ලැබ ඔවුන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ රැකියාව භාර ගන්නා අතර ආයෝජන බැංකුව විසින් ඔවුන් රැකියාවේ යෙදවීමේ කොන්දේසියක් ලෙස අර්ථ සාධක අරමුදලේ "බී" සාමාජිකයන් බවට පත්වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව පත්කරනු ලබන එක් අධ්‍යක්ෂවරයකුගෙන්, සාමාන්‍යාධිකාරිවරයාගෙන් හෝ ඔහු වෙනුවෙන් ඒ අවස්ථාවේ වැඩබලන අයගෙන් සහ අරමුදලේ සාමාජිකයන් විසින් වාර්ෂිකව පත්කරනු ලබන සාමාජිකයකුගෙන්ද සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් අරමුදල පරිපාලනය කෙරේ.